ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව
இலங்கை தகவலறியும் உரிமைக்கான ஆணைக்குழு
RIGHT TO INFORMATION COMMISSION OF SRI LANKA

---

## <u>තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව විසින් යෝජිත විගණන පනත් කෙටුම්පත පිළිබඳ ප්‍රකාශය</u>

**<u>ජුනි 1, 2018</u>**

ශ්‍රී ලංකාවේ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ඵලදායීව ක්‍රියාත්මක කරවීමේ වගකීම ප්‍රකාරව, තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව, පනතේ ඇති මූලික ප්‍රතිපත්තියක් වන ජනතාවගේ දැනගැනීමට ඇති අයිතිය සුරැකීමේ වැදගත්කම අවධාරණය කර සිටියි.

මීට අදාළව සිහි කැඳවා සිටින්නේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත, පනතේ සඳහන් කර ඇති නිශ්චිත අවස්ථා වලදී හැර (ජාතික ආරක්ෂාව, පෞද්ගලිකත්වය, නීතිය හා සාමය යනාදි අවස්ථා) උපරිම අනාවරණ ප්‍රතිපත්තිය මත පදනම්වුවක් බවයි. මෙම අවස්ථාද, සියල්ල අභිබවා පවතින මහජන සුභසිද්ධියට යටත් වේ. ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යම්කිසි විශේෂිත වර්ගයකට හෝ පන්තියකට අයත් ලේඛන හෝ යම්කිසි කාර්යාලයක ක්‍රියාකාරීත්වය, තොරතුරු අපේක්ෂකයන්ගේ රැහැනෙන් මුක්ත නොකරයි.

ඒ අනුව වර්තමානයේ පොදු වසමේ පවතින කෙටුම්පත් නීතින් මගින්, තෝරාගන්නා ලද රාජ්‍ය ආයතන, අන්‍යය ආයතනයන්ට සාපේක්ෂව වාසිදායක තත්ත්වයක තැබීමටත්, එවැනි ආයතනයන්හි නියමිත සහ නිසි ක්‍රියාකාරීත්වය පිළිබඳව තොරතුරු විමසා සිටින පුරවැසියන්ට එරෙහිව පොදුවේ තහනම් පැමිණවීමටත්, එවැනි ආයතන සඳහා පමණක් වරප්‍රසාද සහිත වාතාවරණයන් ගොඩනගන්නේද යන්න සම්බන්ධයෙන් සාධාරණ ප්‍රශ්නයක් ඉස්මතු වී ඇත.

මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව තම විශේෂිතවූ අවධානය, යෝජිත සහ දැනට පාර්ලිමේන්තුව ඉදිරියේ තිබෙන විගණන පනත් කෙටුම්පතේ 9 (1) (ආ) වගන්තිය (2018.03.16 දිනැති ගැසට් පත) වන, විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්, විගණන පනත යටතේ යම් ධුරයකට පත් කරනු ලැබූ තැනැත්තෙකු හෝ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එම කාර්යයට සහය වන වෙනත් යම් තැනැත්තෙකු හෝ විගනකාධිපතිවරයා විසින් තත්කාර්ය සඳහා සේවයේ යොදවනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු මේ පනත යටතේ තම කාර්යය ඉටු කිරීමේදී තමාට දැනගැනීමට ලැබුණු යම් තොරතුරක්, ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව ඉදිරියේ ලේඛන ගත කොට තොරතුරු ලබා

දෙන පුද්ගලයාගේ හෝ ආයතනයේ පෙර කැමැත්ත ලබා ගැනීමෙන් තොරව තොරතුරු හෙළිදරව් නොකළ යුතුය, වෙත යොමු කර සිටියි. ව්‍යතිරේකී අවස්ථා වන්නේ පාර්ලිමේන්තුව විසින් කරන ලද ඉල්ලීමක් අනුව හෝ අධිකරණයේ අඥාවක් මත පමණි.

මෙම පනත් කෙටුම්පත මගින්, මෙම ආරක්ෂාව, කොන්දේසි විරහිතව, පුළුල් තහනමකට ලක්කිරීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍යද යන්න පිළිබඳව කිසිදු තක්සේරු කිරීමකින් තොරව, තොරතුරු හෙළිදරව් කිරීම මගින් බරපතල අගතියක් සිදු වන්නේද යන්නට කිසිදු සැලකිල්ලක් නොමැතිව සහ පාර්ලිමේන්තුවට වාර්තාවක් හෝ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම සඳහා කිසිදු කාල වකවානුවක් නිශ්චිතව සඳහන් නොකර, ලබා දීමට යෝජනා කරයි.

තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව මෙම පුළුල් තහනම මගින් භයානක බලපෑමක් ඇති විය හැකි බව අවධාරණය කර සිටියි. මෙම උත්සුක වීම පනත් කෙටුම්පතේ 'එවැනි යම් තැනැත්තෙකුට එවැනි කරුණක් සන්නිවේදනය කිරීම හෝ එවැනි කරුණකට අදාළ පොත් ලියවිලි හෝ වෙනත් වාර්තාවලට ප්‍රවේශ වීමට අධිකාරී නොලත් පුද්ගලයකුට ඉඩ හරිනු ලබන යම් සාමාජිකයකු හෝ යම් තැනැත්තෙකු හෝ සුදුසුකම් ලත් වෙනත් විගණකවරයකු වරදකට වරදකරු වන්නේය' යන්න සඳහන් කිරීමෙන් තවත් තහවුරු වෙයි. තොරතුරු වලට ප්‍රවේශ වීම පුළුල් ආකාරයෙන් වැලක්වීම සහ එයට එරෙහිව කරනු ලබන තොරතුරු අනාවරණය දඬුවම් ලැබිය හැකි වරදක් කිරීම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ නීතියට හා ජීවගුණයට පටහැනි වේ.

මේ ආකාරයෙන් සමහරෙක් ආයතන සහ පුද්ගලයින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකමින් නිවාරණය කිරීමෙන්, ගෝලීය වශයෙන් පිළිගත් නීතියක් සම්මත කිරීමෙන් ශ්‍රී ලාංකිකයන් සඳහා ලබාගත් ජයග්‍රහණයන් පුලුදු වීමකට ලක්කරවන බවත්, රටේ කළල අවස්ථාවේ සංවර්ධනය වෙමින් පවතින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රෙජීමය මත බරපතල ඍණාත්මක බලපෑමක් ඇති කරන බවත්, පොදු අධිකාරීන් විසින් දැනට දක්නට ලැබී ඇති පරිදි විශාල වශයෙන් ධනාත්මකවූ දශක ගණනාවක් පැරණි රහස්‍ය සංස්කෘතිය සහ නෛතික වශයෙන් ලබාදිය යුතු තොරතුරු ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රියාදාමය අහෝසි කිරීමේ පිළිවෙත අධෛර්යමත් කරන බවත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව, අවධාරණය කර සිටියි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ නියෝගය ප්‍රකාරව නිකුත් කරන ලද්දකි.

කාමර අංක: 2- 203-204 ,බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, කොළඹ 07

දුරකථන/ ෆැක්ස්: +94112691625

www.rticommission.lk